Beast Quest
අද්භූත මායා කතා

ADAM BLADE

# LUNA - THE MOON WOLF

# ලූනා හෙවත් වෘක අවතාරය



පරිවර්තනය

තත්සරණී සතරසිංහ

Scanned by CamScanner

ADAM BLADE ගේ

*LUNA - The Moon Wolf*

කතාවේ සිංහල පරිවර්තනය

# ලූනා හෙවත්

# වෘක අවතාරය

Scanned by CamScanner

ADAM BLADE ගේ

*LUNA - The Moon Wolf*

කතාවේ සිංහල පරිවර්තනය

# ලූනා හෙවත් වෘක අවතාරය

පරිවර්තනය

**තත්සරණී සතරසිංහ**

**නිපුන් පොත්**

36 බී 2/1,

සොයිසා පුර,

මොරටුව.

Scanned by CamScanner



Scanned by CamScanner

# ආරම්භය



මරීනාට බකමූණු හඬක් ඇසුණා. ඒ ස්නෝවි.

ඇය පොරවාගෙන සිටි පොරවනය ඉවත් කර ඇඳෙන් බැස සෙමින් ජනේලය අසලට ගියා. අහස බැස යන හිරු රැස් දහරින් නැහැවී නැඹිලි පැහැයක් ගෙන තිබූ අතර ස්නෝවි ගෙවත්තේ මීයෙකු දඩයම් කරන ආකාරය ඇයට දක්නට ලැබුණා.

ගිම්හානයේ මෙවැනි දිගු සන්ධ්‍යා කාලවල මරීනාට කවදත් නිදිමතක් පැමිණියේ නැහැ. ''මටත් ස්නෝවි එක්ක එළියේ ඉන්න තිබුණානම්...'' ඇය සිතුවා.

ඇය පඩිපෙළ අසලට ගොස් පහත මාලයට එබී බැලුවා. මුළුතැන්ගෙයි වසා තිබූ දොරට පිටුපසින් ඇයගේ දෙමාපියන් සෙමින් කතා බහේ යෙදෙන හඬ ඇයට ඇසුණා.

Scanned by CamScanner

ඔවුන් ඉහළ මහළට පැමිණෙන්නට පෙර ඇයට පිටත විනෝද වීමට පැයක පමණ කාලයක් තිබෙනවා. ස්නෝවි සමග ගෙවත්තේ දුවන්නට ඒ කාලය ප්‍රමාණවත්.

ඇය ශබ්ද නොනැගෙන සේ පඩිපෙළ බැස පිටුපස දොර අසලට ගියා. දොර විවර කරගෙන පිටතට වන් ඇයගේ පාවහන් රහිත දෙපා තෙත තණගොල්ලේ දැවටුණා. ඇය ගෙවත්ත හරහා ඇයගේ සුරතල් බකමූණා වෙත දිව ගියා. ඇය පැමිණෙන අන්දම දුටු ස්නෝවි ඇයව පිළිගන්නට මෙන් හඬ නැගුවා.

''හලෝ...'' මරීනා කතා කළා. ඇය ඔහුට වහන්නට තම අත එසෙව්වා. නමුත් ස්නෝවි සිටියේ ක්‍රීඩාශීලී ලෙසින්. ඔහු ඇය වෙතින් ඉවතට ඉගිල ගොස් වත්ත හරහා ඉගිල ගියා.

මරීනා සිනාසෙමින් ඔහු පසුපස දිව ගියා. ඔහු ඒ වන විටත් හිරු සැගව යමින් සිටි ක්ෂිතිජය දිස් වන නැගෙනහිර පැත්තට ඉගිල ගියා. තැඹිලි පැහැති අහස රෝස පැහැයක් ගනිමින් තිබුණා.

''ස්නෝවි...'' ඇය කතා කළා. ''ස්නෝවි... ආපසු එන්න.''

ඔහු ඉගිල යමින් සිටියේ ඇවන්ටියාවේ නැගෙනහිර පැත්තට වෙන්නට තහනම් කලාපය වෙන් වන සේ බැඳ ඇති ගල් තාප්පය දෙසට. ඇය බලා සිටියදීම ඔහු තාප්පයට ඉහළින් ඉගිල ගියා. අනතුරුව ඔහු අතුරුදහන් වුණා.

මරීනාගේ ගමනේ වේගය අඩාල වුණා. ඇය දැන් කරන්නේ කුමක්ද...? තහනම් කලාපයට ඇතුළු නොවන ලෙසට ඇයගේ දෙමව්පියන් ඇයට නිතරම අනතුරු අඟවා තිබුණා. ස්නෝවි ආපසු පැමිණෙනතුරු ඇය බලා සිටියා.

Scanned by CamScanner

එක්වරම ඇයට ඇතින් කෙඳිරියක් ඇසුණා. ස්තෝවිට කරදරයක්.

මරීනා තාප්පය අසලට දිව ගොස් තාප්පය දිගේ ඉහළට නගින්නට පටන් ගත්තා. ගල්වලින් බැඳ තිබූ තාප්පයේ ඇති තරම් සිදුරු තිබුණා. පියාගේ වත්තේ ඇපල් ගස්වලට නැගීමෙන් ලද පුරුද්ද නිසාම ඇයට එය අපහසු වුණේ නැහැ.

ඇය තාප්පයේ එහා පසට පැන්නා.

ඇය ඉදිරියෙන් තිබුණේ විශාල වනාන්තරයක්. බැස යන හිරු කිරණ ගස් මත පතිතව ගස් රතු පැහැයෙන් දිස් වූයේ රුධිරයෙන් ආවරණය වී ඇති ලෙසින්. ඇය තමා අසලම ඇති ගසේ කඳ මත අත තැබුවා. එය තෙත් සහ ඇලෙනසුළු වුණා. අත ආපසු ගත් ඇයට දක්නට ලැබුණේ අතේ තැවරී ඇති රතු පැහැති ඝනකම් දියරයක්. ඇය තිගැස්මට පත්ව කෑ ගැසුවා.



"ස්නෝවි..." ඇයගේ කටහඬ වෙව්ලමින් තිබුණා. "ස්නෝවි... ආපසු යමු."

එවිටම උස් හඬින් කෙරෙන උඩු බිරුමක් නැගුණු අතර ගස් අතරින් දැල්වෙන රතු පැහැ බෝල දෙකක් දිස් වුණා.

ඒ වනාන්තරයේ සිටින සුදු පැහැති ලොමින් වැසුණු සිරුරකින් යුක්ත විශාල වෘකයෙක්. වෘකයාගේ දෑස දැවෙන ගල් අඟුරු මෙන් දිලිසුණා. උගේ කැරකුණු දෙතොල් අතරින් කහ පාට උල් දත් දෙපළ දිස් වුණා. දැවෙන දෑස මරීනා වෙතම යොමු කරගෙන පිටුපස පාදවලින් සිටගත් වෘකයා නැවතත් උඩු බිරුවා. මෘගයාගේ කළු පැහැ නියපොතු පිහි තල මෙන් තියුණු බව මරීනාට පෙනුණා.

හිරු ක්ෂිතිජයේ සැඟව යමින් තිබුණා. අහස අන්ධකාර නිල් පැහැයකට හැරී තිබූ අතර සුදු පැහැ පුන් සඳ වනාන්තරයට ඉහළින් පායා එමින් තිබුණා.

මරීනා පස්සෙන් පස්සට ගියේ ආපසු හැරී දුවන්නට බියෙන්. වෘකයා ඇය වෙත කඩා පනීද...?

සඳ නැගෙන්නට නැගෙන්නට වෘකයා සුදුමැලි පැහැ වෙන්නට පටන් ගත්තා. ගස් අතරින් දැන් වෘක සිරුර මරීනාට දිස් වෙනවා. ඇයගේ සතුරාගේ ස්වරූපය වෙනස් වන ආකාරය ඇයට දක්නට ලැබුණා.

"අවතාරයක් වගේ." ඇය මිමිණුවා.

ඉන්පසු වෘකයා සම්පූර්ණයෙන්ම නොපෙනී ගියා. වෘකයා ගෙන් ඉතිරිව තිබුණේ රාත්‍රී අන්ධකාරයේ දැල්වෙන රතු පැහැති දෑසක් පමණයි.

සීතල සුළඟක් තමා දෙසට හමා එන ආකාරය මරීනාට දැනුණා. වනාන්තරය දෙසින් අතු පතර බිඳෙන

Scanned by CamScanner

ශබ්දයක් ද නැගෙන්නට වුණා.

ස්නෝවි තවත් හඬක් නැගුවා. හිස ඔසවා ඉහළ බැලූ මරීනාට ගස්වලට ඉහළින් පියඹා එන ස්නෝවිව දක්නට ලැබුණා. ඔහු සිටියේ පණපිටින්. නමුත් ඇය බලා සිටියදීම ස්නෝවිගේ පියඹා ඒම නතර වුණා. ඔහුගේ පියාපත් ඔහුගේ සිරුරටම ඇලෙන ආකාරය ඇය දුටුවා. ඔහු සිටියේ පියාඹමින් නොවේ. බිමට වැටෙමින්.

වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර ඔහු මරීනාගේ දෙපා අසල පතිත වුණා. ඔහුගේ පිහාටු ඉරී රුධිරයෙන් නැහැවී තිබුණා.

''ස්නෝවි...'' ඇය කෑ ගසමින් තම මිතුරා අසල දණ ගසා ගත්තා.



Scanned by CamScanner

ඇය ස්නෝවිගේ බිඳී තිබූ සිරුර තම දෑතට ගත්තා. ඇය නැවත නැගිටින විට නරියෙක් ගස් අතරින් ඇය දෙස බලා සිටියා. නරියාට පසුපසින් සිටියේ මුගටියෙක්. එමෙන්ම තවත් නරියෙක්, කැලෑ බල්ලෙක් ද ඔවුන්ට එක්ව සිටියා. උකුස්සන් දෙදෙනෙක් අහසේ පියඹා ආවා. ඔවුන් සමග ස්නෝවිට වඩා විශාල බකමූණෙක් ද ඉගිල ආවා.

සත්තු වනයේ අද්දර නැවතුණා. ඉන්පසු එළිමහන හරහා සෙමින් සෙමින් ඉදිරියට පැමිණෙන්නට වුණා.

''මම දැන් මොකද කරන්නේ...?'' මරීනා තමාටම මුමුණා ගත්තා.

නෙවන වතාවටත් අවතාර වෘකයාගේ උඩු බිරුම ඇයට ඇසුණා. ඒ මොහොතේම කැලෑ සත්තු ඇය වෙත කඩා පනින්නට පටන් ගත්තා.

ඇය හැරී දුවන්නට වුණා. කැලෑ බල්ලා ඇය වෙත පනින්නට උත්සහ කළත් ඇය තහනම් කලාපය වෙන් කරන තාප්පය දිගේ ඉහළට නැග එහා පැත්තට පැන්නා. බිහිසුණු වන සතුන්ගේ ශබ්ද පිටුපසින් ඇසෙද්දී මිය ගිය බකමූණාගේ සිරුර දෑතින් තුරුලු කරගෙනම ඇය නිවස වෙත දිව ගියා.

නිවසට ඇතුළු වීමට පෙර ආපසු හැරී බැලූ ඇයට දක්නට ලැබුණේ තාප්පයට පසුපසින් එහා මෙහා යන අවතාර වෘකයාගේ රත් පැහැ දෑස යි. වෙව්ලා ගිය ඇය නිවසට ඇතුළු වී දොර වසා අගුලු දමා ආපසු ඇඳට දිව ගියා.

ඇය නැවතත් කිසිම දිනක තහනම් කලාපයේ තාප්පය දිගේ ඉහළට නොනගින්නට සිතා ගත්තා. දැන් ඇයගේ හොඳම මිතුරාත් මිය ගිහින්...

Scanned by CamScanner

## 01 දිග ගමනක්.



සීතල සුළඟ හමා යද්දී දඟර ගැසුණු, ප්‍රපාතාකාර මාර්ගය දිගේ ටොම් පහළට ගමන් කරමින් සිටියා. දිව එළියට දමා ගත් සිල්වර් ඔහු අසලින්ම සිටියා. ඔවුන්ට පිටුපසින් එලේනා ප්‍රවේසමෙන් ස්ටෝම්ව පාර දිගේ රැගෙන ආවා.

පාරේ එක් පැත්තක වූයේ දැඩි ප්‍රපාතාකාරී බෑවුමක්. ටොම් පහතට නෙත් හෙලුවා.

''පරිස්සමින්...'' ඔහු තෙපලුවා. ''හෙමින් එන්න.''

සිල්වර් කෙඳිරි ගාමින් ටොම්ගේ අත ලෙව කෑවා.

''බය වෙන්න එපා.'' එලේනා කිව්වා. ''අපිට අපේ බෙලි කඩාගන්න ඕන නැහැ නේද ස්ටෝම්...?'' ඇය අශ්වයාට තට්ටු කළා. ''අපි කොහොමද ලූනාව හඳුනා ගන්නේ...? ඒ මෘගයා මොන වගේද කියලා කියන්න තරම්

Scanned by CamScanner



වෙලාවක් ඔයාගේ තාත්තාට තිබුණේ නැහැනෙ."

ඔවුන් රජුක් නම් යෝධ ගුහා අවතාරය පරාජය කිරීමෙන් පසුව ටැලඩත් පැමිණ ඔවුන්ගේ ඊළඟ සංචාරය ගැන ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබා දුන්නා. පියා දකින හැම වාරයකම ටොම්ට දැනුණේ ආඩම්බරයක්. නපුරු මායාකරු වන මල්වෙල් ඔහුගේ යක්ෂ මායා බලයෙන් ටැලඩත්ව අවතාරයක් බවට පත් කර තිබුණා. ටොම් සහ එලේනා

Scanned by CamScanner

ඔවුන්ගේ සංචාරය සාර්ථකව නිම කර ඇවන්ටියාවේ බලගතු මායා යන්ත්‍රයේ කැබලි සියල්ල එක් කර මල්වෙල්ගේ මායා බලය බිඳ දැමුවහොත් ටැලඩන්ට නැවතත් මිනිස් ස්වරූපයට පත් වෙන්නට පුළුවන්.

"මගේ ජීවිතයේ පණ තියෙනකම් මම පරදින්නේ නැහැ. මොනතරම් භයානක දේවල් සිදු වුණත් කමක් නැහැ." ටොම් සිතුවා.

"ලූනාව දවල් කාලෙදි විතරක් හමුවෙන්න කියලා එයා අපිට අනතුරු ඇඟෙව්වා නේද...?" ටොම් ඇසුවා. "සමහරවිට ඒක හෝඩුවාවක් වෙන්න ඇති."

ඔවුන් පාරේ එක් වංගුවකින් හැරුණු පසු ඔවුන්ට ඉදිරියෙන් ඇති තහනම් කලාපය දිස් වුණා. එය අළු පැහැති හිස් බිමක්. ටොම් වෙව්ලුවා. ඔහුගේ නෙත ගැටෙන මානයේ වූයේ මැරුණු ගස්, වියළි පොළොව සහ දුහුවිලි පිරුණු පර්වත පමණයි.

සිල්වර් කෙඳිරි ගෑවා.

"කිසිම හොඳක් පේන්න නැහැ නේද...?" ටොම් විමසුවා. "හියුගෝ රජතුමා රටවැසියන්ට මේ පැත්තට එන එකත් තහනම් කරලා තියෙන එක ගැන පුදුම වෙන්න දෙයක් නැහැ."

එලේනා සිනාසුණා. "එයා ඒ ගැන කරදර වෙන්න ඕන නැහැ. මොනතරම් උවමනාවක් තිබුණත් කවුරුවත්ම මෙහෙට එන එකක් නැහැ."

"විනාඩියක් නතර වෙලා විවේක ගමු." ටොම් යෝජනා කළා.

උදේ වරුවම ගමන් කර තිබූ නිසා ඔවුන්ට මඳ විවේකයක් අවශ්‍ය වුණා. ස්ටෝම්ගේ සැදෑලයේ තිබූ වතුර බෝතලය අතට ගත් ටොම් එය එලේනා අතට දුන්නා.

Scanned by CamScanner

ඇය දිය පානය කළ අතර ඉන්පසු ටොම් දිය පානය කළා. අනතුරුව ඔහු එහි වූ වතුරෙන් පර්වතයක වූ සිදුරක් පිරෙව්වා. සිල්වර් සහ ස්ටෝම් සතුටින් දිය බොන්නට වුණා.



ටොම් තම දෑතම එසෙව්වා. "සිතියම..." ඔහු උස් හඬින් අණ කළා.

රිදී පැහැති හතරැස් තිරයක් ඔහු ඉදිරියේ හිස් අවකාශයේ දිග හැරුණා. ඔහු බලා සිටියදීම තිරය මත රේඛා සනිටුහන් වෙන්නට පටන් ගත්තා. ඔවුන් තරණය කළ මරණීය ශිඛරත්, පහළින් ඇති තහනම් කලාපයේ විශාල මිටියාවතත් ටොම්ට දිස් වුණා. මිටියාවතේ පාමුලට වෙන්නට මරණීය වනාන්තරය නම් අන්ධකාරය වනයක් තිබුණා.

Scanned by CamScanner

මරණීය වනාන්තරය දිස් වූ කොටසේ තිරය මත රිදී බැහැ බලගතු මායා යන්ත්‍රයේ කුඩා කැබැල්ලක් දිලිසුණා. එය ලබා ගත් පසු ටොම් තමාගේ සංචාරය සම්පූර්ණ කරන්නට තවත් පියවරක් ළං වෙනවා. එනම් ඔහුගේ පියාට සම්පූර්ණ ජීවය සහ ශක්තිය ලබා දෙන්නට ඔහු තවත් පියවරකින් ළං වෙනවා... නමුත් ඒ හා සමගම තමාට රත්තරන් සන්නාහ ඇඳුමෙන් හිමි වන මායා බලයෙන් එක් බලයක් ද අහිමි වන බව ඔහු දැන සිටියා.

*"ඒත් ඒකට හරියන්න මට ප්‍රීතිමත් හැඟීමක් ලැබෙනවානෙ."* ටොම් සිතුවා.

''මේ බලන්න.'' ඔහු කීවේ සිතියමේ ඇති අන්ධකාර වනාන්තරය දක්වමින්. ''මේ තියෙන්නේ බලගතු මායා යන්ත්‍රයේ ඊළඟ කෑල්ල.''

එලේනා ඔහුගේ උරහිසට ඉහළින් එබී බැලුවා. ස්ටෝම් උද්ඝෝෂයෙන් කෙඳිරි ගෑවා. සිල්වර් තියුණු හඬින් බිරුවා.

ටොම් දෑස අතින් ආවරණය කරගෙන මිටියාවත හරහා දෑස් යොමු කළා. ඔහුට ඈත ඇති අන්ධකාර ගස් ගොන්නක් දිස් වුණා. ඔහු ඒ දෙසට අත දිගු කළා.

''අර තියෙන්නේ අන්ධකාර වනාන්තරය වෙන්න ඕන.'' ඔහු කිව්වා. ''අපි පරීක්ෂා කරලා බලමු.''

ඔහු, ඔහුගේ මාමා විසින් ඔහුට ලබා දුන් මායා කොම්පාසුව සාක්කුවෙන් පිටතට ගත්තා. එම කොම්පාසුවේ ඉරණම සහ අනතුර ලෙස සටහන්ව තිබුණා. ඔහු කොම්පාසුව ඉදිරියට කර ඇල්ලුවා. එක්වරම කොම්පාසුවේ කටුව කැරකී එක් තැනක නතර වුණා.

**ඉරණම**

Scanned by CamScanner

"ඒ ගැන කිසිම සැකයක් නැහැ." ටොම් කිව්වා. "අපි යන්න ඕන ඒ පැත්තට."

"ගමන දුරයි." එලේනා තෙපලුවා. "අපිට හෙට වෙනකම් එහෙට යන්න ලැබෙන එකක් නැහැ. අපි අද මේ කන්ද පහළට බහිමු."

ටොම් කොම්පාසුව නැවතත් තම සාක්කුවට දා ගත්තා.

"අපිට වැඩි වෙලාවක් ගන්න බැහැ." ඔහු කිව්වා. "මගේ තාත්තාගේ ජීවිතය අපි ආරක්ෂා කරන්න ඕන. අපි කන්ද පහළට වේගයෙන් යන්න පුළුවන් විදිහේ පාරක් හොයා ගමු."

"අපේ බෙල්ල කඩාගෙනද...?" එලේනා ඇසුවා.

ඇය නිවැරදි යි. එක් සංචාරයකදී ආක්ටා නම් කඳුකර යෝධයා ටොම්ට ලබා දුන් පිහාටුවෙන් ඔහුගේ ජීවිතය නිතරම ආරක්ෂා වෙනවා. නමුත් අනිත් අයට මුහුණ දීමට සිදු වනු ඇත්තේ අනතුරකට.

ටොම් ප්‍රපාතාකාර බෑවුම දෙස බැලුවේ කල්පනාවක ගැලෙමින්. එක්වරම ඔහු අපූරු අදහසක් සිතට පිවිසි නියායෙන් හඬක් පිට කළා.

"මම දන්නවා අපි කරන්න ඕන මොනවද කියලා" මිතුරන් වෙත හැරෙමින් ඔහු පැවසුවා.

Scanned by CamScanner

## 02. භයානක බෑස්මක්



''කොහෙද පහළට බහින්න තියෙන කෙටිම දුරක් තියෙන්නේ...?'' ටොම් විමසුවා.

''අතැන.'' එලේනා කිව්වා.

''හරි.'' ටොම් පැවසුවා. ''එහෙනම් එතැන තමයි මේ කන්දෙන් පහළට බහින ඉක්මන්ම පාර තියෙන්නේ...''

''කෙලින්ම පහළට බහින්න.'' එලේනා ඇසුවේ සිනාවකින් මුහුණ සරසා ගනිමින්. ''ඒත් කොහොමද ඒක කරන්නේ...?''

''ඔයා ගාව ලණුවක් තියෙනවා නේද...?'' ටොම් ඇසුවා.

එලේනා තමා සතුව තිබූ ශක්තිමත් සිහින් ලණුවක් ඔහුට දුන්නා. ටොම් අඩි පාරේ ගැට්ට දෙස හොඳින් බැලුවා.

Scanned by CamScanner

''නියමයි... අපිට පුළුවන් ලණුවේ එක් කෙළවරක් මේ ගල වටේ ගැට ගහන්න.''

එලේනා, ටොම් පෙන්නූ ගල වටා ලණුවේ එක් කෙළවරක් ගැට ගැසුවා. ඇය ලණුව තදින් ඇද බලා ටොම් දෙස බලා හිස වැනුවා. ඔහු අඩි පාර අද්දරට ගොස් පහළ බැලුවා. බෑවුම ප්‍රපාතාකාර එකක්. එහි පහළ ඈත කෙළවරේ කුඩා ඉරක් මෙන් අඩි පාරේ ඉතිරි කොටස දිස් වුණා.

''සත්තුන්ට මොකද කරන්නේ...?'' ස්ටෝම් සහ සිල්වර් දෙස නෙත් හෙලූ එලේනා විමසුවා.

''අපි නැත්නම් එයාලාට වේගෙන් යන්න පුළුවන්.'' ටොම් කිව්වා. ''එයාලාට පුළුවන් පාර දිගේ ඇවිත් පහළදි අපිව හමු වෙන්න.''

''ලණුව දිග ඇති කියලා ඔයාට විශ්වාස ද...?'' එලේනා විමසුවා.

''ඒක හොයාගන්න තියෙන්නේ එක විදිහක් විතරයි.'' ටොම් ඇයට පැවසුවා. ඔහු ලණුව පර්වතයෙන් පහළට විසි කළා. ලණුව පහතට වැටෙන 'වුෂ්' ශබ්දය ඔවුන්ට ඇසුණා. පහත බැලූ ටොම්ට සහ එලේනාට දක්නට ලැබුණේ පහතට එල්ලී ඇති ලණුව යි.

''අපිට වෙන්නේ පුළුවන් තරම් දුරක් ලණුව දිගේ පහළට බැහැලා ඉතිරි ටික බිමට පනින්න.'' එලේනා පැවසුවා. ''ලණුව දිග මදි වුණොත් ආපහු ලණුව දිගේ උඩට නගින්න නම් පුළුවන් වෙන එකක් නැහැ.''

එලේනා නිවැරදි බව ටොම්ට වැටහුණා. නමුත් ඔහු පසුබැස්සේ නැහැ. ''මම මුලින්ම යන්නම්.'' ඔහු තම මිතුරියට පැවසුවා.

ඔහු ලණුව අල්ලාගෙන හිමින් පහළට බැස්සා. ටොම්

Scanned by CamScanner

කරන දේ වටහා ගන්නට උත්සහ දරමින් සිල්වර් ඔහු දෙස එබී බලාගෙන සිටියා.

වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර ටොම් ලණුවේ එල්ලී පර්වත මුහුණත දිගේ පහළට බසිමින් සිටියා. ලණුවට කැපී දැත සුදු පැහැ වූ අතර ඔහු තම දණහිස්වලින් ද ලණුව අල්ලා ගත්තා. මේ අත්දමින් හෙමින් හෙමින් අත් මාරු කර ලණුව අල්ලා ගනිමින් ඔහු පහළට බසින්නට වුණා.

ඉහළ බෑවුම සෑම මොහොතකම ටොම්ට දක්නට ලැබුණේ පර්වත ගැට්ටියෙන් පහළට එබී බලාගෙන සිටින එලේනා, ස්ටෝම් සහ සිල්වර් ව.

''ගැට්ටට ගොඩක් ළං වෙන්න එපා.'' ඔහු කිව්වා.

ඔහුගේ අත් සහ මස්පිඬු ඇදුම් දෙන්නට වුණා. ''මට පුළුවන් මේක කරන්න.'' ඔහු තමාටම කියා ගත්තා. අයිස් මෙන් සීතල සුළඟ හමා ගියේ ලණුව ඒ මේ අත පද්දමින්. විටෙක තමාව පර්වතය වෙතට ගසා ගෙන යන සෙයක් ටොම්ට දැනුණා.



ඔහුගේ දෙකම්මුල්වල රුධිරය රත් වුණා. ඔහු සෙමින් ආශ්වාස කළා. ඒ රත්තරන් දම්වැලේ ශක්තිය හදවත වෙත

ලබා ගන්නට උත්සහ කරමින්.

මඳ වෙලාවකට පසු ටොම්ට නැවතත් පහළට බසින්නට ධෛර්යය ලැබුණා. ඔහු මුලින්ම දකුණු අතින් ලණුව අල්ලාගෙන පහළට බැස්සා. අනතුරුව වම් අතින් ලණුව අල්ලා ගත්තා. ඉන්පසු දෑතම අත්හැර දණහිස්වලින් ලණුව අල්ලා ගත්තා. නැවතත් දකුණු අතින් ලණුව අල්ලාගෙන බසින්නට වුණා. මේ අන්දමට පහළට බසින රිද්මය ඔහු සොයා ගත්තා.

"ඔයා දැන් ගොඩක් දුර ගිහින් ඉන්නේ ටොම්."

එලේනා නෑ ගසා කිව්වා.

"ඔයාට ඒක කරන්න පුළුවන්."

ඔහු පහතට නෙත් යොමු කළා. ඔහුට පහළින් විශාල බැවුමක් තිබුණේ නැහැ. පහත තිබුණේ මධ්‍යම ප්‍රමාණයේ ගසක තරමේ උසක්. නමුත් ලණුව පොළොව මට්ටමට දිගු වුණේ නැහැ. ඒ ආසන්නයටවත් දිග තිබුණේ නැහැ.

දැන් ඔහු කුමක්ද කරන්නේ...?

පනිනවද...?

එක්වරම ටොම්ට ඔහුට පහතින් වූ ගලක් දැකිය හැකි වුණා. ඔහුට ඒ මතට පැන ගත හැකිවුණොත් මඳ විවේකයක් ලබා ගන්නට පුළුවන්.

ඒ හැර ඔහුට කළ හැකි අන් යමක් තිබුණේ නැහැ.

ටොම් ගැඹුරු හුස්මක් ගෙන ලණුව අත් හැරියා. ඔහු බිමට වැටෙන්නට පටන් ගත්තා. වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර ඔහුගේ පාද ගල මත ගැටුණා.

ගල මත මඳ වෙලාවක් සිටි ඔහු අනතුරුව ගලෙන් බිමට පැන්නා. ඔහු පොළොව මත පතිත වූයේ දෑත සහ දෙපා තදින් බිම වදින ලෙසින්.

Scanned by CamScanner



''ටොම්... ඔයා හොඳින් ද...?''එලේනා විමසුවා. ඔහුට ඇයව පෙනුණේ ඉතා ඈතින් කුඩාවට.


බිම වැටී සිටි ටොම් නැගිට්ටා.

ඔහුට ද ඇය පෙනුණේ ඉතා කුඩාවට. එහෙත් ඔහු ඒ බවක් කීවෙ නැහැ.

''මම හොඳින්...'' ඔහු පෙරළා කෑ ගසා කිව්වා.

''දැන් ඔයාගේ වාරෙ.''

Scanned by CamScanner



එලේනා පහළට බසින්නට පටන් ගත්තා. ටොම් ඒ දෙස බලා සිටියා. ඇය ලණුවේ කෙළවරට පැමිණි පසු ඔහු කතා කළා. ''පහළ ගලක් තියෙනවා හිටගන්න තරම් ලොකු. ඔයාට ඒක පේනවද...?''

''ඔව්...'' එලේනා කිව්වා.

ඇය ගල මත සිට ගත්තා. ගල මත සිට ගනිත්ම ඇයගේ දෙපා ලිස්සා ගොස් ඇය ගලෙන් බිමට පතිත වන අන්දම ටොම්ට පෙනුණා. ඔහු වහා ඇය අල්ලා ගන්නා අදහසින් ඉදිරියට පැන්නා. එලේනා ඔහු මත පතිත වී බිම ඇද වැටුණා. දෙදෙනාම පොළොව මත රෝල් වී ගියා. ඔවුන් යළි සිට ගත්තේ දූහුවිලෙන් නැහැවී නමුත් සිනාසෙමින්.

''ස්තුතියි.'' එලේනා කිව්වා.

Scanned by CamScanner

අනතුරුව එලේනා සිල්වර්ට විසිල් කළා. විසිල් හඬ පැහැදිලි ලෙස නැගුණා. සිල්වර්ට නිතරම එම විසිල් හඬ හඳුනා ගන්නට පුළුවන්. ඔහු ලණුව ගැට ගසා ඇති ගල අසලට ගමන් කරන අන්දම ටොම්ට දිස් වුණා. මඳ වෙලාවකට පසු ලණුව ටොම් සහ එලේනා අසල බිම මත පතිත වුණා.

"මම එයාට උගන්නලා තියෙන්නේ ලණුවක් ලිහන විදිහ." එලේනා පැහැදිලි කළා. "ඒත් මම කවදාවත් හිතුවේ නැහැ ඒක ප්‍රයෝජනවත් වෙයි කියලා." ඇය ලණුව ඔතා ඊතල මල්ලේ තැන්පත් කළා.

මේ අතර ස්ටෝම් සහ සිල්වර් හැකි තරම් වේගයෙන් අඩි පාර දිගේ පහළට පැමිණෙමින් සිටියා. වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර ටොම්ට සහ එලේනාට තමන් අසලට එන සතුන් දෙදෙනාව පෙනුණා.

"අපූරුයි." ස්ටෝම්ගේ ගෙලට තට්ටු කරමින් ටොම් කිව්වා. එලේනා සිල්වර්ගේ හිස අත ගෑවා.

"අපිට විවේක ගන්න වෙලාවක් නැහැ." ඇය තෙපලුවා. "අපි ගමන පටන් ගමු."

ඔවුන් ඉක්මනින්ම මිටියාවත කෙළවරට ළඟා වුණා. ඔහුන්ට මරණයේ වනාන්තරය වඩා හොඳින් දිස් වුණා. එහි ළඟා වෙන්නට ඔවුන්ට දින භාගයක්වත් ගත වෙන එකක් නැහැ. ඈතින් පෙනෙන තුරු මුදුන් දෙස බැලූ ටොම් හිරි වැටුණා.

"අපි එතනට ළඟයි එලේනා..." ඔහු පැවසුවා. "ලූනා අපි එනකම් බලාගෙන ඇති."

Scanned by CamScanner

## 03. තහනම් මිටියාවතෙන්



ඔවුන් දුහුවිලි පිරුණු වියළි මිටියාවත මතින් ඇවිද යන්නට වුණා. බොහෝ දුරක් ගමන් කළ ද මරණයේ වනාන්තරයට ළඟා වෙන්නට ඔවුන්ට හැකි වූයේ නැහැ. ටොම්ට දැනුණේ වෙහෙසකර බවක් මෙන්ම මෝඩ වූ සෙයක්. ඔහුගේ පාද රිදුම් දුන්නා. ඔහු එලේනා වෙත නෙත් හෙලුවා. ඇය ද සිටියේ ඔහු මෙන්ම වෙහෙසට පත්ව. ඇයගේ සිරුර දුහුවිල්ලෙන් නැහැවී තිබුණු අතර ඇයගේ මුහුණින් වෙහෙස දිස් වුණා. ස්ටෝම් සහ සිල්වර් ද සිටියේ හති දමමින්. මේ වන විට හිරු බැස යමින් තිබුණා.

''අපි නැවතිලා විවේක ගන්න ඕන. අපිට වෙන කරන්න දෙයක් නැහැ.'' ටොම් කිව්වා. ''අපිට බොන්න දෙයකුත් ඕන.''

එලේනා තම වතුර බෝතලය අතට ගෙන සෙලෙව්වා. එහි ඉතිරිව තිබුණේ ජලය ස්වල්පයක් පමණයි. තම බෝතලයේ ජලය එපමණක්වත් නොමැති බව ටොම්

Scanned by CamScanner

දැන සිටියා.

''අපි වතුර හොයාගන්න ඕන.'' ටොම් පැවසුවා.

''අර බලන්න.'' එලේනා කිව්වා. ''අර මොකක්ද...?''

ඇය පෙන්වූයේ මඳක් ඉදිරියෙන් වූ කොළ පැහැති යමක්. ඒ ගල් පර්වත අතර තිබූ කොළ පැහැති පඳුරු කිහිපයක් මැද පිහිටි ජල බුබුළක්. මරණයේ මිටියාවතේ මෙතෙක් ඔවුන්ට හමු වූ එකම ජීවී දෙය එය පමණයි. ඔවුන් වහා දිය බුබුළ වෙත දිව ගියා. එහි ජලය පළිඟු මෙන් පිරිසිදු යි.

සත්තු ද දිය බුබුළ වෙත ආවා. ටොම් දිය කඩිත්ත අසල දණ ගසාගෙන සීතල වතුර දෑතට ගත්තා. ඉන්පසු දිය බොන්නට වුණා. ජලය සීතලයි වගේම නැවුම්. ස්ටෝම් සහ සිල්වර් ද ඇති තරම් දිය පානය කළා. එලේනා දිය බිව්වේ සියල්ලන්ටම පසුව.

''හරිම සීතලයි.'' ඇය පැවසුවා.

''අපිට මේ වෙලාවේ ඕන සීතල වතුර තමයි.'' ටොම් කිව්වා. රජුක් සමග සටනින් පසු සිරුරේ තැවරී තිබූ මඩ සහ දූවිලි ඔහු සෝදා ගත්තා.

''මට බඩගිනියි.'' එලේනා කිව්වේ හිස කෙස් මත රැඳී ඇති ජල බිඳු හිස ගස්සා ඉවත් කරමින්.

ටොම් හිස වැනුවා. ''අපි කෑම කාලා විවේක ගමු. ඒත් අපි ගාව තියෙන්නේ බිස්කට් කිහිපයක් විතරයි...''

''කෑම හොයන එක මට භාර දෙන්න.'' එලේනා කිව්වා. ඇය තම දුන්න ගෙන ඒ මත ඊතලයක් තබා ගත්තා. ''ඔයා ගිනිමැලයක් අවුලන්න. මම උයන්න දෙයක් හොයාගෙන එන්නම්.''

ඇය සිල්වර් ද සමග පිටව ගියා. ටොම් දර කැබලි

Scanned by CamScanner

කිහිපයක් සහ වියළි තණකොළ අහුරු කිහිපයක් සොයා ගත්තා. ඔහු ඒ සියල්ල පැතලි ගලක් මත තබා වියළි ලී කැබලි දෙකක් එකට අතුල්ලන්නට වුණා. දෑත රිදුම් දෙනතුරු ලී කැබලි දෙක ඇතිල්ලූ පසු ලී අතරින් සිහින් දුමාරයක් නගින්නට පටන් ගත්තා. අනතුරුව ගිනි දැල්ලක් පැන නැගී වියළි තණකොළ ගිනි ගත්තා.

ටොම් ප්‍රවේසමෙන් ගිනිමැලය ඇවිළුවා. ගිනිමැලයෙන් නික්මුණු නිල් සහ අළු පැහැ දුමක් අහසට නැගුණා. ගිනිමැලය හොඳින් ඇවිළෙන විට එලේනා විශාල කුරුල්ලන් දෙදෙනෙකු ද රැගෙන පැමිණියා. ටොම් සහ එලේනා දිග ලී කැබලි දෙකක දවටා කුරුල්ලන් දෙදෙනා පිස ගත්තා. මස් පිළිස්සෙන විට නැගෙන සුවඳ ටොම්ගේ මුව තෙත් කළා.

සුවඳ මෙන්ම කුරුලු මස් ද ඉතා රසවත් වුණා. එලේනා ඔවුන් දෙස කෑදර බැල්මක් හෙලාගෙන සිටි සිල්වර් වෙත ද මස් විසි කළා. ස්ටෝම් දිය කඩිත්ත අවට වූ තණ කොළ කමින් සිටියා.

වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර අවට අන්ධකාර වුණා. ඔවුන්ගේ ගිනිමැලයේ ආලෝකය අවට ආලෝකමත් කරන්නට ප්‍රමාණවත් වුණා. ඔහු ඈනුමක් යැව්වා. ''අපි ටිකක් විවේක ගමු. හෙට ලූනාට මුහුණ දෙන්න අපිට මුළු ශක්තියම ඕන වෙනවා.''

''ඔයා හරි.'' එලේනා කිව්වේ හිස මත දෑත බැඳ ගනිමින්. ''සුභ රාත්‍රියක්.'' ඇය බිම වැතිරුණා. සිල්වර් ඇය සමීපයේ නිදා ගත්තා. ස්ටෝම් ඔවුන්ට මඳ දුරක් ඈතින් සිටගෙන සිටියා.

Scanned by CamScanner



ටොම් ද බිම වැතිර දෑස් පියා ගත්තා. නමුත් ඉක්මනින්ම ඔහු වෙත නින්ද ළඟා වූයේ නැහැ. සංචාරයන් තුනක් අවසන් වන විට තමාට අහිමි වූ ශක්තිය ගැන නොසිතා සිටින්නට ඔහුට හැකි වූයේ නැහැ. මේ වන විට උඩ පනින්නට තිබූ මායා බලය, මායා කඩුවේ බලය මෙන්ම දිවීමේ අමතර වේගය ද ඔහුට අහිමි වී තිබුණා.

Scanned by CamScanner

ටැලඩන්ට ඔහුගේ සැබෑ ස්වරූපය හිමි වෙන්නට වෙන්නට ටොම් සතු මායා බලය එකින් එක අහිමි වුණා.



"මගේ මායා බලය නැති වෙනවා." ඔහු සිතුවා.

ඔහු වාඩි වී ගිනිමැලයේ ගිනිදැල් දෙස බලාගෙන සිටියා. තණකොළ අතර හමා යන සුළඟේ නාදය ඔහුට

Scanned by CamScanner

ඇසුණා. ඒ අතරම ගිනිමැලය වටා සැරිසරන කුඩා සතුන්ගේ අඩි හඬ ඇසුණා.

ඔහු අන්ධකාරය දෙස හොඳින් නෙත් යොමු කළද ගිනිමැලයේ ආලෝකය හැර අන් කිසිවක් ඔහුට පෙනුණේ නැහැ. එක්වරම ඔහුට පිහියක ශබ්දයක් මෙන් හඬක් ඇසුණා.

එය බිහිසුණු වෘක උඩුබිරුමක්...

එය ඇසුණේ ඉතාම ආසන්නයෙන්. සිල්වර් මෙන් සතෙකුගේ රූපයෙ ටොම්ගේ සිතේ ඇඳුණා. නමුත් ඒ සිල්වර්ට වඩා ශක්තිමත් සතෙක්. ඔහු වහා කඩුව අතින් ගෙන නැගිට්ටා. ඔහුගේ හදවත තිබුණේ වේගයෙන් ගැහෙමින්. එක්වරම අන්ධකාරය තුළ ගින්දර මෙන් දිදුලන රතු පැහැ බෝල දෙකක් ඔහුට දිස් වුණා. එය දෑසක් විය යුතු යි. එම දෑස තිබුණේ ඔහු සමීපයට පැමිණෙමින්.

කිසියම් සතෙක් ටොම් වෙත පැමිණෙමින් සිටියා.

Scanned by CamScanner

# 04. මාරාන්තික ප්‍රහාරයක්



රතු දෑස වේගවත්ව තමා දෙසට ඇදෙද්දී ටොම් වහා එලේනා නිදා සිටි තැනට දිව ගියා. එසේ දිව යන අතර ටොම්ට ගිනිමැලයට පසුපසින් ඇති දේ කුමක්දැයි දැකිය හැකි වුණා. මඳ ආලෝකයෙන් ඔහුට දිස් වූයේ වන සතුන් පිරිසක්. නරියන්, මීයන්, කැලෑ බල්ලන් මෙන්ම බැජර් වර්ගයට අයත් සතුන් ද එහි සිටියා. අඳුරේ වුවද ඔවුන්ගේ විලිස්සාගෙන සිටින දත් පවා ටොම්ට පෙනුණා. ඇම්බර් මැණික් මෙන් ගිනිගෙන දැවෙන රතු පැහැ දෑස තිබුණේ ඒ සතුන්ට පිටුපසින්.

"එලේනා..." ටොම් මිමිණුවා.

සිල්වර් වහා අවදි වුණා. ඔහු නැගිටින විටම ඔහුගේ පිටේ වූ ලොම් කෙලින් වුණා. ඔහු ටොම් ඉදිරියට පැමිණෙන්නට වුණා. ඔහුගේ දිගු කන් එසවී තිබූ අතර ඔහුගේ තළ පැහැ දෙතොල් අතරින් ගෙරවීමක් නැගුණා. ඔහුගේ

Scanned by CamScanner

දෑසේ රැඳී තිබුණේ මරණීය ආලෝකයක්. ටොම් මින් පෙර කිසිම දිනක ඒ අයුරින් සිල්වර්ව දැක තිබුණේ නැහැ.

වෘකයාගේ උගුරෙන් නැගුණ ගෙරවීම තව තවත් වැඩි වුණා.

''ඒයි... සිල්වර්... මේ මම.'' ටොම් පැවසුවා. '' මොකක්ද ප්‍රශ්නෙ...?''

''ඇයි මොකද...?'' එලේනා ද අවදි වෙමින් විමසුවා.

සිල්වර් බිම දිගා වී ඉලක්කය මතට පනින්නට සූදානම් වුණා.

''එයා පනින්න හදන්නේ...'' ටොම් සිතුවා. එවිටම සිල්වර් ඔහු වෙත පිම්මක් පැන්නා.



ටොම් පසෙකට පනින්නට උත්සහ කළා. ඈතට පනින්නට හැකි මායා බලයකින් යුත් රන් බූට් පාවහන් යුවළේ බලය තමා වෙතින් ඉවත් වී ඇති බව ටොම්ට වැටහෙන විට ඔහු ප්‍රමාද වැඩියි. සිල්වර්, ටොම්ගේ පපුව මත පතිත වූ

Scanned by CamScanner

අතර දෙදෙනාම බිම පෙරළුණා. ඒ දූවිල්ලෙන් නැහැවෙමින් සිල්වර්ගේ ලොම්වලින් නැගෙන සුවඳින් ටොම්ගේ නාසය පිරුණා.

"සිල්වර්..." එලේනාගේ කෑ ගැසීම ටොම් ට ඇසුණා. "නවතින්න."

ටොම් සිටියේ බිම වැතිර. සිල්වර්ගේ ශක්තිමත් සිරුරේ බර ඔහුට දැනුණා. වෘකයාගේ තියුණු නිය දිගුව තිබුණේ ඔහුගේ මුහුණ වෙත. ඔහු වෘකයාව තම සිරුර මතින් ඉවතට තල්ලු කර දමන්නට උත්සාහ කළා. සිල්වර්ගේ දත් ඔහුගේ සම් ජැකට්ටුවට කා වැදුණා.

ස්ටෝම් බියපත්ව හඬ නැගුවා.

"සිල්වර්... එපා..." එලේනා කෑ ගැසුවා.

ඇය සිල්වර්ගේ ගෙලේ ලොම්වලින් අල්ලා ඔහුව ඉවතට අදින්නට නැත් කළා. සිල්වර් ගොරවමින් ඇයව හපා කන්නට හැරුණා. ඔහුගේ දත් පහරට ඇයගේ අත මග හැරුණේ යන්තමින්.

"පැත්තකට වෙන්න." ටොම් හති දමමින් කිව්වා. " එයාට පිස්සු හැදිලා."

එලේනාට පිටුපසින් ගිනිමැලය වටා රොක් වී බලා සිටින වන සතුන්ගේ දෑස් ටොම්ගේ නෙත ගැටුණා. ඔවුන්ගේ පහර දීමකට පෙර කෙතරම් වෙලාවක් ඔවුන්ට ඉතිරිව තිබේවිද...?

කඩිනමින් කල්පනා කරන අතරම ටොම් තම කඩුව ගෙන එහි තලය සිල්වර්ගේ මුහුණ වෙත දිගු කළා. වෘකයා බිහිසුණු ලෙස ගෙරෙව්වා. ඔහුගේ දෑස දෙස බැලූ ටොම්ට දක්නට ලැබුණේ එහි පිරී ඇති කෝපය පමණයි. ඔවුන්ගේ මිතුරාට සිදුව තිබෙන්නේ කුමක්ද...? ටොම් කඩුව තදින්

Scanned by CamScanner

අල්ලාගෙන සිල්වර්ව තල්ලු කරන්නට වුණා.



"සිල්වර්..." එලේනා කෑ ගැසුවා.

ඇය සිටියේ නැවතත් සිල්වර්ගේ පිටේ වූ ලොම්වලින් අල්ලා ඉවතට අදිමින්. වෘකයා සිරුර ගස්සා ඇයව ඉවතට වීසි කළා.

ඔවුන් වටා රැස්ව සිටි සතුන්ගේ ප්‍රමාණය ඉහළ යන

Scanned by CamScanner

බව ටොම්ට දක්නට ලැබුණා. මීයන්, නරියන්, බැජර් සතුන්, කැලෑ බල්ලන් ගොරවමින් බලා සිටියා.

"එලේනා... අර සත්තු එලවලා දාන්න." ටොම් කිව්වා.

එලේනා දැවෙමින් තිබූ අත්තක් අතට ගෙන එය සතුන් වෙත විසි කළා. ඔවුන් ගොරවමින් පසුපසට ගියා.

අද්භූත රතු දෑස ද අන්ධකාරය තුළ ගිනිමැලය වටා රවුමට ඇවිදිමින් සිටියා. එම දෑස සමීප වූ විටක ටොම් දුටුවේ එය අදෘශ්‍යමාන වූ සතෙකුට අයත් දෑසක් බවයි. ගිනිමැලයේ ආලෝකයෙන් ලොම්, සිරුරක් හෝ නිය, දත් ආදිය ද ටොම්ට දිස් වූයේ නැහැ. ඒ මංගයා වෙන්නට ඕන. සියලුම මංගයින්ට අවතාර තත්ත්වයකට පත් විය හැකි බව ටොම් දැන සිටියා.

ලූනා නැවතත් උඩුබිරුවා. එවිට ගිනිමැලයේ අනිත් පස සිටි බල්ලන් සහ නරියන් ගොරවමින් ඉදිරියට එන්නට වුණා. සිල්වර් යළිත් වරක් පෙරටත් වඩා බිහිසුණු ලෙස ටොම්ට පහර දෙන්නට වුණා.

"මංගයා මේ සත්තුන්ව පාලනය කරනවා." ටොම් සිතුවා. "එයා තමයි එළාලාව මෙහෙයවන්නේ. සිල්වර් ඉන්නෙත් එයාගේ බලපෑමට යටත් වෙලා."

ස්ටෝම් තම පාදවලින් පහර දෙමින් වන සතුන් වෙත දිව ගියා. ඔවුන් මොහොතකට පසුපසට වුණා. ලූනා නැවතත් උඩුබිරුවා. වන සතුන් යළිත් ඉදිරියට එන්නට වුණා.

ඔවුන් මේ මොහොතේ ඉදිරියට පැමිණියේ ගිනිමැලයේ හැම පැත්තකින්ම. එලේනා ගිනි ගෙන දැවෙන ලීයක් අත තබාගෙන විශාල බල්ලෙක් සමග සටන් වදිමින් සිටියා. වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර ඇය කෑ ගසාගෙන බිම ඇද වැටුණා.

Scanned by CamScanner



ටොම්ට දක්නට ලැබුණේ ඇයගේ දෑස බියෙන් පිරී තිබූ බව යි.

තම නිදහස්ව තිබූ අත ඔහු එලේනා වෙත දිගු කළ ද සිල්වර් මේ වන විට වෙනත් ආකාරයකට සටනට පිවිස

සිටියා. ඔහු ටොම්ගේ අතේ වූ කඩුව තම දත්වලට සිරකරගෙන පසෙකට ඇද දමන්නට සූදානම් වුණා. මොහොතකින් තම අත වූ කඩුව බිම වැටෙන අන්දම ගිනිමැලයේ ආලෝකයෙන් ටොම්ට පෙනුණා. ඉන්පසු සිල්වර් තම සිරුරේ සියලු බර ටොම් වෙත බර කරමින් ඔහුගේ මුහුණම තම සතකම් ලොම්වලින් වසා ගත්තා. ටොම්, වෘකයාව ඉවතට ඇද දමන්නට උත්සාහ කළත් එය කළ හැකි වූයේ නැහැ.

සඳ එළියට සිල්වර්ගේ දත් දිලිසුණා. වෘකයාගේ උණුසුම් සුසුම්වල පහස මුහුණට දැනෙන විට ටොම් හිස පසෙකට හරවා ගත්තා. සතා ටොම්ගේ සිරුර මත සිට ටොම්ගේ සම ඉරා දමන්නට සැරසුණා.

"එපා සිල්වර්..." ඔහු කෑ ගැසුවා. නමුත් හිස හරවා සිල්වර් දෙස බැලූ ටොම්ට සිල්වර්ගේ දෑසේ වූයේ පෙර තිබූ ආලෝකමත් බව නොවන බව දිස් වුණා. සිල්වර්ගේ දෑසේ තිබුණේ යක්ෂ පෙනුමක්.

දැන් කළ හැකි යමක් නැහැ. සිල්වර්ට ඇවසි නම් මරා දමන්නට නම් ටොම්ට ඊට එරෙහිව කළ හැකි දෙයක් තිබුණේ නැහැ.

Scanned by CamScanner

## 05. සිල්වර් පැරදවීම.



"අල්ලාගෙන ඉන්න." එලේනා කෑ ගැසුවේ දෙපා මත සිට ගනිමින්.

මීයෙක් ටොම්ගේ පාද අසලට දිව ආ අතර ඌ සපා කන්නට පෙර පා පහරකින් පලවා හරින්නට ටොම් සමත් වුණා.

ඔහු සිටියේ සිල්වර්ගේ බර නිසා පොළොව මතට ඇලීගෙන. නමුත් එලේනා ඊතල මල්ලේ තිබූ ලණු කැරැල්ල පිටතට ගන්නා අන්දම ඔහුට පෙනුණා. ඇය කඩිනමින් එහි ගැට කිහිපයක් ගසන්නට වුණා.

"ඉක්මන් කරන්න." ටොම් හතිදමමින් කිව්වා.

ස්ටෝම් ගොරවමින් තම පසු පාදවලින් කැලෑ බල්ලන්, තාරියන් සහ අනෙකුත් සතුන් වෙත පහර දෙමින් සිටියා.

"ඔන්න." එලේනා කිව්වා.

ඒ කිසියම් දෙයක් සිල්වර්ගේ පිට මත හෙලමින්.

Scanned by CamScanner

ඇය ලණුවෙන් දැලක් වියා තිබුණා. සිල්වර් ගොරවමින් දැලෙන් නිදහස් වෙන්නට උත්සහ කළා. නමුත් දඟලන්නට දඟලන්නට ඔහු තව තවත් දැලේ පැටලුණා.



සිල්වර්ගේ අවධානය අන් දෙයකට යොමු වූ ඇසිල්ලෙහි ටොම් තම අවස්ථාව ලබා ගත්තා. ඔහු වහා වෘකයා යටින් ඉවතට පෙරළුණා. ඒ සමගම ඔහුගේ දණහිසක් කිසිවක ගැටුණා.

ඒ ඔහුගේ කඩුව. ඔහු වහා කඩුව අතට ගෙන දැලෙහි

පටලා කඩුව පොළොවට සවි කළා. දැල එක් කොනකින් බිමට සවිව තිබුණද සිල්වර්ට ඒතම මොහොතක පහසුවෙන් ඉන් නිදහස් වෙන්නට පුළුවන්.

එලේනා දුන්නට ඊතලයක් තබා දැලේ අනිත් පසට විද දැල පොළොවට සවි කළා.

''තන්ක්...''

සිල්වර් කෝපයෙන් ගෙරෙව්වා.

''තන්ක්...''

''තන්ක්...''

මේ අන්දමට දැල පොළොවට සවි කරන්නට ඔවුන් සමත් වුණා. සිල්වර් සිටියේ උගුලකට අසුව. ඔහු දැඟලුවද ඔහුට දැලෙන් නිදහස් වෙන්නට හැකි වූයේ නැහැ.

ඔහු හති දමමින් දැලෙන් නිදහස් වෙන්නට උත්සහ කළා. නමුත් අවසානයේ ඔහු පරාද වුණා.

ස්ටෝම් කෙඳිරි ගෑවා. ටොම් ඔවුන්ව වට කරගෙන සිටි කැලෑ සතුන් දෙස බැලුවා. ස්ටෝම් පරදිනවාත් සමග වන සතුන්ගේ උද්යෝගය ද මැකී ගොස් තිබුණා. ඔවුන් සෙමින් සෙමින් පසුබසිමින් සිටියා. ලූනාගේ ගිනිගත් දෑස ද සෙමින් පසුපසට ගමන් කරමින් තිබුණා.

ටොම් සැනසුම් සුසුමක් හෙලුවා.

''මට නම් තේරෙන්නේ නැහැ.'' එලේනා කිව්වා. ''සිල්වර් මේ විදිහට හැසිරෙනවා මම කවදාවත් දැකලා නැහැ.''

''ඒක එයාගේ වරදක් නෙවෙයි.'' ටොම් ඇයට පෙන්වා දුන්නා. ''ඒ මෘගයාගේ මායාවක්... එයා සිල්වර්ව උමතු කරලා.''

''මෘගයා...?'' එලේනා විමසුවේ වටපිට බලමින්.

''ඔයා දැක්කේ නැද්ද අර ඇස් දෙක...?'' ටොම් ඇසුවේ එය පෙන්වමින්.

Scanned by CamScanner

ගිනිගත් දෑස අන්ධකාරයේ දැවෙමින් තිබුණා. නමුත් ටොම් සහ එලේනා බලා සිටින විට එය නොපෙනී ගියා.

"අපි ලූනාව ප්‍රබුද්ධිතවාද...?" එලේනා ඇසුවා.

ටොම්, සිල්වර් දෙස බැලුවා. ඔහු හිස වැනුවා. "අපිට ඊට වඩා වැදගත් දෙයක් කරන්න තියෙනවා."

ඔවුන් වෘකයා අසල වාඩි වුණා. එලේනා දැල තුළින් අත දමා වෘකයාගේ ලොම් අත ගෑවා. ඔහු ගෙරෙව්වා.

"ඔයා හිතන්නේ එයා ආයෙමත් හිටිය තත්ත්වෙට පත්වෙයි කියලද...?"

එලේනා නොසන්සුන්ව ඇසුවා.

"මම එහෙම හිතනවා." ටොම් කිව්වා. "අපිට පුළුවන් මොකද වෙන්නේ කියලා බලා ඉන්න විතරයි."

ඔවුන්ගේ හිස්වලට ඉහළින් සුදු පැහැ සඳ වලාකුළු අතරින් පාව යමින් තිබුණා. සඳ මුළුමනින්ම සම්පූර්ණ වී තිබුණේ නැහැ. ස්ටෝම් කෙඳිරිලි හඬ නැගුවා. ඔවුන් වටකර ගෙන සිටි වන සතුන් ඒ වන විට නොපෙනී ගොස් සිටියා.

ටොම් සහ එලේනා ගිනිමැලය නිවී යන අන්දම බලා සිටියා.

"මට පුදුම ලූනා ඇයි සිල්වර්ව උමතු කළේ කියලා...?" මඳ වෙලාවකට පසු එලේනා කිව්වා. "ඇයි ස්ටෝම්ට එහෙම කළේ නැත්තේ...?"

ටොම් තම හිස කසා ගත්තා. "සිල්වරුයි අනිත් සත්තුයි වනාන්තරයෙන් පිටතට ආව අය... එයාලා සේරම කැලෑ සත්තු. ස්ටෝම් පුහුණු කරපු සතෙක්. අනිත් එක... සිල්වර් කියන්නෙත් වෘකයෙක්." අදෘශ්‍යමාන මෘගයාගේ වෘක උඩුබිරුම සිහිපත් වූ ටොම් කිව්වා.

"ලූනාට එයාව පාලනය කරන්න බලයක් තියෙනවා කියලා ඒකෙන් පැහැදිලියි." එලේනා තෙපලුවා.

"අපිට එරෙහි වෙන මූලිකම දේ තමා ඒක." ටොම්

Scanned by CamScanner

පැවසුවා. "වෘකයෝ අනිත් සත්තු වගේ නෙවෙයි. එයාලා කැලෑ සත්තු බවට පත් වුණාම හොඳටම භයානකයි."

"ඇයි ලූනාම අපිට පහර දුන්නේ නැත්තේ...?" එලේනා විමසුවේ විස්මයෙන්.

"මම දන්නේ නැහැ. සමහරවිට අපිට අනතුරු අඟවන්න වෙන්න ඇති. අපිව බය කරලා එලවලා දාන්න."

"ඒත් අපි බයේ පැනලා යන්නේ නැහැ." එලේනා කිව්වා.

"ඔව්." ටොම් එයට එකඟ වුණා.

අනතුරුව ඔවුන් නැවතත් නින්දට වැටුණා.

පසුදින උදෑසනින්ම අවදි වුණේ ටොම්. නැගෙනහිර අහස ඒ වනවිට ආලෝකමත් වෙමින් තිබුණා. ඒ ක්ෂිතිජයෙන් හිරු අහසට මෝදු කරමින්.

සිල්වර් කෙඳිරිලි හඬ නැඟුවා. එලේනා දැල දමා තිබියදීම සිල්වර් අසලට ළං වුණා. මේ වතාවේ සිල්වර් ගෙරෙව්වේ නැහැ. නමුත් මෘදු ලෙස කෙඳිරි ගෑවා.

එලේනා ටොම් වෙත හැරුණා. "ඔයා මොකද හිතන්නේ...? එයාව නිදහස් කරාට කමක් නැද්ද...?"

"උත්සහ කරලා බලමු." ටොම් කිව්වා. දෙදෙනාම එක්ව බිමට සවි කර තිබූ ඊතල ඇද ගැලෙව්වා. ටොම් තම කඩුව ද ගලවාගෙන බඳ පටියේ සවි කර ගත්තා.

අනතුරුව ඔහු සහ එලේනා එකිනෙකා දෙස බලා ගත්තා. ඉන්පසු ඔවුන් දැලේ කොනකින් අල්ලා ඇද එය ඉවත් කළා.

Scanned by CamScanner

මුලින්ම සිල්වර් පිටතට ආවේ නැහැ. ඔහු සිටියේ මළු පැටවෙකු මෙන් දුර්වලව. නමුත් මොහොතකට පසු ඔහු හිස ඔසවා ටොම් දෙස බැලුවා. ඒ වනවිට ඔහුගේ දෑසේ පිළී තිබූ කුරිරු බව ඉවත්ව තිබුණා. ඔහු ගෙත් දිස් වූයේ ලැජ්ජා වන බවක්. ඔහු සෙමින් ඉදිරියට පැමිණ එලේනාගේ පාදයක් මත හිස තැබුවා. එලේනා ඔහුව පිරිමැද්දා.

"හරි... හරි..." ඇය මිමිණුවා. සිල්වර් ඇයගේ අත ලෙව කෑවා.

ටොම් නැගිට මරණීය වනාන්තරය වෙත නෙත් හෙලුවා. ලූනා එහි වාසය කරන බව ටොම්ට විශ්වාසයි. ඔහු සහ එලේනා ඇය සොයා එහි යනවා. ඊළඟ වනාවේ සටන මීට වඩා බිහිසුණු බව නිසැක යි.

"ඔයාට බැහැ මාව පරදවන්න." ඔහු පැවසුවා. දෙවන වතාවේ ඔහු ලූනාට අවස්ථාවක් දෙන්නේ නැහැ.

Scanned by CamScanner

# 06. මරණීය වනාන්තරය



ඔවුන්ගේ උදෑසන ආහාරය වූයේ ඇපල් සහ දිය කඩිත්තෙන් ලබා ගත් ජලය පමණයි. සිල්වර් කිසිම දෙයක් කෑවෙ නැහැ. එලේනා ඔහුට දුන් බිස්කට් කෑබැල්ල දෙසවත් ඔහු බැලුවේ නැහැ. ජලය ස්වල්පයක් පානය කළ ඔහු හිස තම ඉදිරි පාද මත තබා ගත්තා.

"තවම එයාව හොඳ මදි." එලේනා කිව්වා.

සටනින් ටොම්ගේ ශක්තිය ද බොහෝ සේ වැය වී තිබුණා.

"හොඳයි... අපි කොහොමහරි යන්න ඕන." ඔහු කිව්වා. "ලූනා ආවේ හඳ අහසේ හොඳට පායා තිබුණ වෙලාවේ. ඒ නිසා හඳ පායන්න කලින් අපි එයාව හොයාගත්ත ඕන එලේනා. එයාව පරාජය කරන්න තියෙන්නේ අපිට ඒ අවස්ථාව විතරයි."

එයට එකඟ වන ලෙසින් ස්ටෝම් ද හඬ නැගුවා.

අපතේ යවන්නට කාලයක් තිබුණේ නැහැ. ටොම් තම මිතුරන් සමග මරණීය වනාන්තරය වෙත පිය නගන්නට

Scanned by CamScanner

වුණා. එලේනා, ස්ටෝම්ගේ සෑදෑලය මත වාඩි වී ගමන් කළ අතර ටොම් සහ සිල්වර් ඔවුන් අසලින් ගමන් කළා. ඉක්මනින්ම ඔවුන් විශාල වනාන්තරය අසලට සමීප වුණා.



මෙසේ ඔවුන් මරණීය වනාන්තරය අසලට ළඟා වන විට අහසේ තිබුණේ මඳ ආලෝකයක්. හිරු සෙමින් සෙමින් බැස යමින් තිබුණා. තමන් මෙතෙක් ආ මඟ දෙස හැරී බැලූ ටොම්ට දක්නට ලැබුණේ ඔවුන්ගේ සෙවනැලි

Scanned by CamScanner

ඔවුන්ට පිටුපසින් වැටී ඇති අන්දමයි. බැස යන හිරු කිරණ පතිත වී ඔවුන් ඉදිරියෙන් වූ ගස් දිලිසෙමින් තිබුණා.

"උහ්..." එලේනා බලාපොරොත්තු සුන් වූ හඬක් නැගුවා. "ඒ පාට හරියට ලේවල පාට වගේ."

"ඒක ඉර එළිය නිසා සිදු වුණ දෙයක්." ටොම් පැවසුවා. "එන්න... යමු... ලූනා කොහේහරි ඇති. අපි එයාව කළුවර වැටෙන්න කලින් සොයාගන්න ඕන."

ටොම් තම පිට මත රඳවාගෙන සිටි පලිහ සහ බඳ පටියේ තිබූ කඩුව අතට ගත්තා. ඉන්පසු ඔවුන් වනාන්තරයට ඇතුළු වුණා. ඔවුන්ගේ පාදවලට පෑගුණු වියළි කොළ සහ අතුවලින් හඬක් නැගුනා. එලේනා ගසක් දෙකක් පසු කරන අතර ගසක් අත ගා බැලුවා. අනතුරුව ඇය කෑ ගැසුවා.

"ඇයි...? ඇයි මොකද...?" ටොම් වහා විමසුවා.

"මගේ අත දිහා බලන්න." එලේනා තෙපලුවේ විස්මයෙන්.

ටොම් දෑස් විසල් කර බැලුවා. ඇයගේ අත පුරාම අතු පැහැති රුධිරය තැවරී තිබුණා. වනාන්තරයේ තිබූ සියලුම ගස්වල කඳේ රුධිරය වන් රතු පැහැති ද්‍රවයක් තිබුණා.

ඔවුන් වනාන්තරය තුළට පිය තගන්නට වුණා.

ටොම් සිටියේ වෙව්ලමින්. ස්ටෝම් නොසන්සුන්ව කෙඳිරිලි හඬ නැගුවා. සිල්වර් ද කෙඳිරි ගෑවා.

"අපිට සැලසුමක් ඕන." ටොම් පැවසුවේ වටපිට බලමින්. "මෙතැන එක එක විදිහේ යක්ෂ මායාවන් තියෙනවා. අපි මුහුණ දෙන්න යන්නේ යෝධ, බලවත් අවතාර වෘකයෙකුට. මෙතැන මේ විදිහ නම් අපිට ඕන වෙනවා අපිව ආරක්ෂා කරන්න පුළුවන් විදිහේ..."

"ආයුධයක්..." එලේනා කතාවට බාධා කළා.

"ඔව්." ටොම් තෙපලුවා.

ඇය නිවැරදියි. ඔහු සතුව කඩුවක් එලේනා සතුව දුනු

Scanned by CamScanner

ඊතලත් තිබුණා. නමුත් එය ප්‍රමාණවත් නොවන බව ඔහු දැන සිටියා. සතුරන්ට එරෙහිව ඔවුන්ට තවත් අමතර ආයුධයක් අවශ්‍යය යි.



Scanned by CamScanner

ඔහු මඳක් වනාන්තරයෙන් පිටතට පැමිණ තහනම් මිටියාවත දෙස බැල්මක් හෙලුවා. ඔවුන්ට ආරක්ෂාවට භාවිත කළ හැක්කේ කුමක්ද...?

නමුත් එහි එවන් කිසිදු යමක් තිබුණේ නැහැ. තහනම් මිටියාවතේ සජීවී දෙයකට තිබුණේ දූහුවිල්ලෙන් පිරුණු පොළොව, පර්වත කිහිපයක් සහ වියළි තණ පඳුරු පමණයි.

හිරු වේගයෙන් බැස යමින් තිබුණා. කාලය ඉක්මනින්ම ගත වෙනවා.

රුධිරය තැවරුණු ගස් සහිත මරණීය වනාන්තරය තුළින් ටොම්ට විවිධ ශබ්ද ඇසෙන්නට වුණා. මුලින්ම යාන්තමින් ඇසුණු ශබ්ද කෙමෙන් කෙමෙන් වැඩි වෙන්නට පටන් ගත්තා. ටොම්ගේ හද ගැස්ම වේගවත් වුණා. ඒ අතරින් ඈතින් නැගුණු චංක උඩු බිරුමක් ගස් අතර දෝංකාර දෙන්නට වුණා.

හිරු බැස යත්ම මරණීය වනාන්තරය පණ ලබමින් සිටියා.

•

Scanned by CamScanner